# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1996 අංක 8 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1996 මාර්තු මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1996 මාර්තු මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

# 1996 අංක 8 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1996 මාර්තු මස 26 වන දින.]

එල්. ඩී.—ඕ. 5/95

**ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ සේවයෙහි නියුක්ත කර සිට පසුව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් සේවයෙහි නියුක්ත කරන ලද නිලධරයන්ට හා සේවකයන්ට විශ්‍රාම වැටුපක් ප්‍රදානය කිරීමට සුදුසුකම් ලැබීමට හැකිවනු පිණිස විශේෂ විධිවිධාන සැලසීම සඳහා ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1996 අංක 8 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

2. 1967 ජනවාරි මස 05 වන දින ට පෙරාතුවම වූ දිනයේ දී ගුවන් විදුලි දෙපාර්තමේන්තුවෙහි සේවයෙහි නියුක්ත කර සිට පසුව සංස්ථාව විසින් සේවයෙහි නියුක්ත කරන ලද මාරුවීම් සහිත සේවයක සිටි නිලධරයකු හෝ සේවකයකු නොවන සෑම නිලධරයකු ම සහ සේවකයකු ම සංස්ථාව විසින් ඔහු සේවයෙහි නියුක්ත කර සිටියේ වුවද, සංස්ථාව විසින් ඔහු සේවයෙහි නියුක්ත කරන ලද දිනයේ සිට සංස්ථාවේ ඔහුගේ සේවා කාලය අවසානය දක්වා ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයකු වශයෙන් ධුරය දිගටම දැරූ ලෙස සලකනු ලැබිය යුතුය. තවද, ඔහුගේ සංස්ථාවේ සේවා කාලය ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ වූ සේවා කාලයට එකතු කළ විට අවුරුදු දශයකට හෝ ඊට වැඩිවන්නේ නම්, ඔහුගේ සංස්ථාවේ වූ සේවා කාලය අවසානයේදී, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ වූ විශ්‍රාම වැටුපක් ප්‍රදානය කිරීමට ඔහු සුදුස්සකු විය යුතු ය.

ගුවන් විදුලි දෙපාර්තමේන්තු සේවයේ නියුක්තව සිට පසුව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් සේවයෙහි යොදවන ලද නිලධරයන්ට හා සේවකයන්ට විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම.

3. 2 වන වගන්තිය යටතේ විශ්‍රාම වැටුපක් ප්‍රදානය කරනු ලැබීමට සුදුස්සකු බවට පත්වන සෑම තැනැත්තකුට ම, සංස්ථාවෙහි ස්ථිර සේවා නියුක්තිය ඔහු විසින් භාරගැනීම මත විශ්‍රාම වැටුප වෙනුවට ඔහුට ගෙවා ඇති යම් පාරිතෝෂික මුදලක්, ඔහු විසින් හෝ ඔහුගේ උරුමක්කාරයන් විසින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයාට ගෙවිය යුතු ආපසු ගෙවීමකට යටත්ව, ඒ විශ්‍රාම වැටුප ලැබිය යුතු ය.

ප්‍රදානය කිරීමට පෙර සපුරාලිය යුතු කොන්දේසි.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු බව.

5. පද සම්බන්ධතාවයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතේ—

අර්ථ නිරූපණය.

“සංස්ථාව” යන්නෙන්, 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව පනතින් පිහිටුවනු ලද ශ්‍රී ලංකා ගුවන්